**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2018**

-----------------------------------------------------

පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල අතර 2013 ජනවාරි 30 දින එළඹි අංක 886 දරන ණය ගිවිසුමේ ඡේද 1 හි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, වර්ථමානයේ මහාමාර්ග හා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර, සබරගමුව, නැගෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම සහ උතුරු පළාත්වල මඟී සහ භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම වර්ධනය වීමට මුහුණ දීම සඳහා සහ වාහන මෙහෙය වීමේ වියදම් හා මාර්ග නඩත්තු වියදම්, ප්‍රවාහන කාලය හා අනතුරු අවම කිරීම මඟින් ආර්ථික හා සමාජ දියුණුව සඳහා දායක වීම සඳහා මංතීරු දෙකකින් යුතු පාලම් 25 ක් ඉදි කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 4,632 කට ඇමෙරිකානු ඩොලර් මිලියන 38.41 වන අතර එම මුදල සැපයීමට අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ එහි කටයුතු 2015 සැප්තැම්බර් 07 දින ආරම්භ කළ අතර 2017 සැප්තැම්බර් 05 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය අවස්ථා දෙකකදී 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

--------------------------------------

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.**

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ පැකේජ 1 යටතේ ඉදි කරන ලද පාලම් 08 ක කෙරීගෙන යන වැඩ වටිනාකම වෙනම හදුනා ගෙන සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා නොතිබුණි. | කෙරීගෙන යන වැඩවල වටිනාකමට අදාල විස්තර නොතිබීම. | එකඟ වෙමි. සෑම පාලමකටම අදාල සෘජුව ආරෝපනය කළ හැකි පිරිවැය 2019 වර්ෂයේ ගිණුම්වල දැක්වීමට කටයුතු කරමි. | ඉදිකිරීම් කටයුතු අවසන් වූ පාලම්වලට අදාල වත්කම්වල පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරියට බාරදිය හැකි වන පරිදි වෙන වෙනම හෙළිදරව් කළ යුතුය. |

**03.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාවලිය | 2018 දෙසැම්බර් 31 දිට භෞතික ප්‍රගතිය | | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත ප්‍රතිශතය | ළඟා කරගත් ප්‍රතිශතය | | | |
| පැකේජ 01 | පාලම් 08 ක් පුළුල් කිරීම සඳහා නැවත ඉදිකිරීම | 100 | 67 | පාර්ශවකරුවන්ට නිසි වේලාවට අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වීමට නොහැකි විය. | කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාවේ දුර්වලතා සහ සේවා යෝජක සහ සේවා දායක අතර පැවති සාමාන්‍ය කාල සැලසුමට නොඑකඟ වීම නිසා කාර්ය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | ණය ගිවිසුම අනුව කාල, භෞතික සහ මූල්‍ය අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| පැකේජ 02 | පාලම් 09 ක් පුළුල් කිරීම සඳහා නැවත ඉදිකිරීම | පාලම්වල සැලසුම්වැඩ අවසන් කර ඇති නමුත් ලංසු ලේඛන පිළියෙල කිරීම සිදු කෙරෙමින් පවතී. | | -එම- | සිවිල් ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්තුව 2019 දී ප්‍රදානය කර ඇත. | |
| පැකේජ 03 | පාලම් 08 ක් පුළුල් කිරීම සඳහා නැවත ඉදිකිරීම | විශේෂඥයෙකු තෝරා ගැනීම සඳහා කටයුතු කර ඇත. | | -එම- | සුදුසු විශේෂඥයෙකු තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම 2019 වර්ෂයේ දී සම්පූර්ණ කර ඇත. | |

**3.2 පද්ධති හා පාලන**

**---------------------**

| **විගණන නිරීක්ෂණ** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| පැකේජ 01 හි ඉතිරි සිවිල් වැඩ සම්පූර්ණ කර ගැනීම සඳහා නිදහස් කළ රු. මිලියන 49 ක් වටිනා විශේෂ අත්තිකාරම් සඳහා ඇප බැඳුම්කරයක් කොන්ත්‍රාත්කරුගේ දුර්වල මූල්‍ය ධාරිතාවය පිළිබඳ අවධානය යොමු කරමින් ලබාගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු අත්තිකාරම් නුවමනා ලෙස පක්ෂග්‍රාහීවීමෙන් අයකර ගැනීම සැකසහිත විය. | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව අත්තිකාරම් නිදහස් කර ඇත. | ගෙවීම්හි නෛතිකභාවය යලි සළකා බැලීම අවශ්‍ය වන අතර ලැබිය යුතු මුදල් හැකි විගස අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |